Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 10

විෂය - ව්‍යාපාර සංඛ්‍යානය

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය ,රත්නපුර

නිපුණතාව 8.0 - ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන කල්පිත පරීක්ෂාව යොදා ගනියි.

නිපුණතා මට්ටම 8.1 - සංඛ්‍යාන කල්පිත පරීක්ෂාව සම්බන්ධ සංකල්ප අධ්‍යයනය කරයි.

- සංගහන පරාමිතිය සම්බන්ධයෙන් තාවකාලිකව සත්‍යයක් සේ සලකා ගොඩ නගා ගනු ලබන තාර්කික උපකල්පනය සංඛ්‍යාන කල්පිතයක් නම් වේ.මෙය ප්‍රකාශනයකින් හෝ සංකේතාත්මකව දැක්විය හැකිය.
- අදාළ සංගහනයෙන් සසම්භාවීව නියැදියක් ලබා ගෙන නියැදි තොරතුරු අනුව සංඛ්‍යාන කල්පිතය සත්‍යද අසත්‍යද යන්න පරීක්ෂා කිරීම සංඛ්‍යාන කල්පිත පරීක්ෂාව නම් වේ.
- අධ්‍යයනයට අදාළ සංගහනය,
  - ✓ අපරිමිත විට හෝ
  - ✓ පරීක්ෂාවේදී ඒකක විනාශ වන විට හෝ
  - ✓ අධ්‍යයනය සඳහා ප්‍රමාණවත් තරම් සම්පත්(කාලය,ශ්‍රමය,මුදල්)නොමැති විට

  අදාළ සංගහනයෙන් ලබා ගත් නියැදි තොරතුරු ඇසුරෙන් සංගහන පරාමිතිය ඇස්තමේන්තු කිරීමට සිදු වේ.එවැනි අවස්ථාවලදී යොදාගත හැකි විද්‍යාත්මක ශිල්පීය ක්‍රමයකි;සංඛ්‍යාන කල්පිත පරීක්ෂාව.

**<u>අභ්‍යාස</u>**

පහත අවස්ථා සඳහා කල්පිත ගොඩනගන්න.

1. විදුලි බල්බ නිෂ්පාදන ආයතනයක නිපදවන විදුලි බල්බයක සාමාන්‍ය ආයු කාලය පැය 26,000 ව පැවතුණි.නව සූත්‍රිකා විශේෂයක් හඳුන්වා දුන් පසු ආයතනය නිපදවන විදුලි බුබුලක ආයු කාලය වැඩි වන බව නිෂ්පාදන ආයතනය ප්‍රකාශ කරයි.
2. කිරිපිටි නිෂ්පාදන ආයතනයක නිපදවන 100g ක අඩංගු මේදය ප්‍රමාණයේ මධ්‍යන්‍යය 12g ව පැවතුණි.නව තාක්ෂණය යොදා ගැනීම නිසා කිරිපිටිවල අඩංගු මේද ප්‍රමාණය අඩු වී ඇති බව නිෂ්පාදන සමාගම ප්‍රකාශ කරයි.
3. එක්තරා ගොවි ජනපදයක බොහෝ කාලයක සිට යල කන්නයේදී හෙක්ටයාර එකකින් ලබන මධ්‍යන්‍ය වී අස්වැන්න 3200kg ලෙස අනාවරණය කර ගෙන ඇත.පසුගිය යල කන්නයේදී නව බිත්තර වී ප්‍රභේදයක් හා නව වගා ක්‍රම කිහිපයක් අත්හදා බලන ලදී.එම කන්නයේ එම ජනපදයේ ගොවි මහතෙකු සත්‍ය වශයෙන් හෙක්ටයාර් එකකට ලබා ගත් අස්වැන්නෙහි වෙසෙසි වෙනසක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කළ යුතුව ඇත.